## ශාකයයි සංස්කෘතියයි

# උක්

කග දල සෙමෙර මල් පියයුරු (ද) තණ රද
තණපත් උවගු උගු ඉගු ඉක් අමා රද
අසිපත් මදුරු මල මුල් අමර වියු සඳ
සැකෙවින් වෙති සැම උක් වගට මන නද

මේ රටේ ආර්ථිකය කෙරෙහි වැදගත් මෙහෙයක් ඉටු කරන උක් ගස ඉගු, උගු, ඉක්ෂු තණරද, සෙමෙර මල්, කග දල, ඉක් ආදී නම් වලින් හැඳින්වෙන තෘණ රාජයෙකි. උක් ගල්ල, උක් වත්ත, උක්පිටිය, ඉලුක්තැන්න ආදී ගම් වලට උක් ගස නෑකම් කියයි.

"දත් නැතිදා උක් දඬු ගිනි තපින්ඩද ?" වැනි ප්‍රස්ථාව පිරුළු අප බසට එක් වී ඇත. අනංගයා ගේ දුන්න උක් ගසකින් තනාගත් එකක් බව අපේ සාහිත්‍යයට එක් වී ඇත. උක් ගස කාමාශාව වර්ධනය කරන්නක් නිසා එබඳු සංකල්පයක් පහළ වුවා විය හැකිය. "උක් දඬු දුන්න" නමින් කලකට පෙර කාව්‍ය සංග්‍රයක් ද පළ විය. උක් සකුරු චතු මධුර වලට අයත් වුවකි. දෙවියන්ට පිදෙන පුජා වට්ටිය-ටද උක් දඬු කැබලි ඇතුලත් කෙරේ. නවගමුව, කඩුවෙල වැනි දේවාල උත්සව කාල වලදී විකිණීම සඳහා උක් ගස් මග දෙපස තබා ඇති අන්දම හැකිය.

# අනංගයාගේ උක්දඬු දුන්න



සීනි නිෂ්පාදනය සඳහා උක් වැවීම මේ රටේ ආරම්භ වුයේ මෑතකදීය. ගල් ඔය, මොනරාගල වැනි වියලි කලාපීය ප්‍රදේශවල හොඳින් උක් වගාව කළ හැකිය. එම පෙදෙස් වල උක් වගාව නිසා එක්තරා අන්දමක සංස්කෘතික පරිණාමයක් ද සිදු වී ගෙන යන බව පෙනේ. අපේ පැරැන්නෝ පැණි හකුරු කර්මාන්තය සඳහා උක් වැවුහ. පැරණි සිංහල රජතුමකු පවා උක් යන්ත්‍රයක මෙහෙකොට ලබාගත් වැටුපෙන් භික්ෂුන් වහන්සේලාට දන්දුන් බව වංශ කථාවේ සඳහන් වේ.

කලු උක් ආයුර්වේද ඔසුවකි. කැස්ස, සරම්ප වැනි රෝග වැලඳුණු කල උක් පැණි දීමට අපේ අය පුරුදුව සිටිති. සමහර බෙහෙත් ගුලි උක් පැණියෙන් අඹරන්නට නියමිතය. බෙහෙත් තෙල් සඳහාද උක් පැණි යොදන අවස්ථා ඇත. උක් වර්ගයට අයත් රඹුක්, වැලුක්, ඉලුක් වැනි ශාකයන්ද අයුර්වේද ඖෂධ වශයෙන් යොදා ගැනේ. ඉලුක් දඬු යුෂ බොන්ට දීම නයි විෂට හොඳය. අරිෂ්ට නිපදවීමටද උක් පැණි ගනු ලැබේ.

උක් දඬු මිරිකා ගත් පසු ඉතිරි වන රොඩ්ඩ කඩදාසි වැනි කර්මාන්ත සඳහා යොදා ගැනේ.

අරක්කු, කසිප්පු වැනි සැර මත්පැන් වර්ග පෙරා ගනු සඳහා උක් පැණි යොදා ගැනේ.



විශ්‍රාමලත් විදුහල්පති
ශාස්ත්‍රවේදී
### නා.ලි. සාර්ලිස් අමරසිරි

උක් වර්ගයට අයත් නොවු එහෙත් උක් නාමයෙන් හැඳින්වෙන තෘණ නොවන ශාක පවුලක්ද ඇත. දලුක්, පතුක්, සීනුක් ඔසු වර්ග උක් නමින් හැඳින්වෙන්නේ ඇයි දැයි නොදන්නෙමු.

විශ්‍රාම ලත් විදුහල්පති
ශාස්ත්‍රවේදී
### නා.ලි. සාර්ලිස් අමරසිරි

# සිංහල චිත්‍රපටයක මංගල දැක්ම ප්‍රථම වරට මෙල්බන් හිදී

## උදයකාන්ත සෙනසුරු මාරුවත් සමගින් මෙල්බන් රජවංශයෙන් ඔබ්බට

ශ්‍රීනාත් මද්දුමගේ

,

**සෙනසුරු මාරුව සිනමාපටයේ මංගල දර්ශනය මෙල්බන්හිදී පවත්වන්නට ඔබ හිතුවෙ ඇයි?**



මා මේවන විට චිත්‍රපට 19ක් නිර්මාණය කර තිබෙනවා. එයින් විශාල ප්‍රමාණයක් ඕස්ට්‍රේලියාවේ තිරගත වුණා. මගේ නිර්මාණ සමගින් ඕස්ට්‍රේලියාට පැමිණෙන්නත් මට හැකිවුණා. ඒ ගමන් වල දී මගේ සිනමා නිර්මාණ අගය කරන බුද්ධිමත් ප්‍රේක්ෂකයන් පිරිසක් මෙහිදී මට හමුවුණා. මගේ නවතම



සිනමා නිර්මාණයේ මංගල දර්ශනය මෙල්බන් හිදී කරන්නට මම තීරණය කළේ එනිසා යි. මේ චිත්‍රපටයේ සුවිශේෂී කාරණයක් තිබෙනවා. අපේ ප්‍රවීණ තිර රචක අධ්‍යක්ෂක ආචාර්ය තිස්ස අබේසේකර අතින් ලියවුණ අවසාන තිර රචනාව මෙයයි. මේ තිරගත කිරීම ඔහුට ගෞරවයක් ලෙස මම සළකනවා. මේ දර්ශනය සංවිධානය කරන්න බාරගත් ඊජ්සීසී පදනමටත් මගේ ස්තුතිය පුද කරන්න කැමතියි.

**මේ සිනමා පටය ගැන යමක් කියන්න පුලුවන්ද?**

ශ්‍රී ලංකා සමාජය වෙලා ගිනිමින් තිබෙන අර්බුදකාරී වාතාවරණය පිළිබඳවත් ඒවා මෙහෙයවන බලවේග පිළිබඳවත් මෙහිදී කතා වෙනවා. මේ සියල්ල අතරින් ගලා යන සුන්දර කතාවකුත් මෙහි තිබෙනවා. මේ කතාව මං හෙළිදරව් කරනවාට වඩා ඔබට පැමිණ නරඹන ලෙස මම ඉල්ලා සිටිනවා. තරුණ තරුණියන් ඉලක්ක කරගෙන කළ මේ සුන්දර නිර්මාණය හැමෙ දනාටම රස විඳිය හැකි සිනමා පටයක් බව කියන්න කැමතියි. මම හිතනවා අපේ තරුණ පරම්පරාව මේ සිනමා පටයට බොහෝ ඇලුම් කරයි කියලා.

මාත් සමගින් මෙහි රඟපාන නලු නිළියන් කීප දෙනෙකුත් පැමිණීමට අදහස් කරගෙන ඉන්නවා. ඩැන්ඩිනොන් රීඩින් සිනමා ශාලාවේදී ජූලි 29 වන දා පැවැත්වෙන සෙනසුරු මාරුව මංගල දර්ශනයට පැමිණ අප හමුවන ලෙස මම සැමට ආරාධනා කරන්න කැමතියි.

# භක්ති ගී



සේයා රූ - ප්‍රසන්න නාමල් කුරුකුලසූරිය